ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

இலங்கைப் பாராளுமன்றம்

**Parliament of Sri Lanka**



# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2015

වැය ශීර්ෂය
தலைப்பு
**Head**
16

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

இலங்கைப் பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே

**Parliament of Sri Lanka, Sri Jayewardenepura Kotte**

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
# ශීර්ෂ අංකය 16
# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015
## පටුන


| අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 1. | මෙහෙවර | 1 |
| 2. | ප්‍රධාන කාර්යයන් | 1 |
| 3. | සංවිධාන ව්‍යුහය | 1 - 5 |
| 4. | කාර්ය මණ්ඩල තොරතුරු | 5 |
| 5. | **වාර්ෂික කාර්ය සාධනය** | |
| 5.1 | මූල්‍ය පරිපාලනය | 6 - 12 |
| 5.2 | කාරක සභා | |
| 5.2.1 | උපදේශක කාරක සභා | 12 |
| 5.2.2 | විශේෂ කාර්යයන් සඳහා වූ කාරක සභා | |
| (i) | තේරීම් කාරක සභාව | 13 |
| (ii) | වරප්‍රසාද පිළිබඳ කාරක සභාව | 13 |
| (iii) | උසස් නිලතල පිළිබඳ කාරක සභාව | 13 |
| (iv) | ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව | 13 |
| (v) | රාජ්‍ය ගිණුම් කාරක සභාව | 13 - 14 |
| (vi) | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව | 14 - 15 |
| (vii) | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව | 16 - 17 |
| 5.2.3 | විශේෂ කාරක සභා | 17 - 18 |
| 5.3 | පනත් කෙටුම්පත් කාර්යාංශය | 18 - 19 |
| 5.4 | සභාලේඛන කාර්යාංශය | 19 - 20 |
| 5.5 | අනෙකුත් ආයතනික අංශ මඟින් සැපයූ දායකත්වය සැකෙවින් | |
| 1) | වේත්‍රධාරී දෙපාර්තමේන්තුව | 21 - 23 |
| 2) | හැන්සාඩ් දෙපාර්තමේන්තුව | 23 |
| 3) | පාර්ලිමේන්තු කථා පරිවර්තක කාර්යාලය | 24 |
| 4) | පාර්ලිමේන්තු පුස්තකාලය | 25 |
| 5) | ආයතන / මන්ත්‍රී සේවා /අභ්‍යන්තර විගණන කාර්යාංශ | 25 - 26 |
| 6) | විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය | 26 |
| 7) | තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව | 27 |
| **පාර්ලිමේන්තුවේ සංවිධාන ව්‍යුහය** | - රූප සටහන - ( ඇමුණුම - 01 ) | 28 |
| **2015 වර්ෂය තුළදී සම්මත වූ ශ්‍රී ලංකාවේ පනත් කෙටුම්පත්** | - ( ඇමුණුම - 02 ) | 29 – 30 |

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ශීර්ෂ අංකය - 16
## වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015

## 1. මෙහෙවර

ව්‍යවස්ථා සම්පාදකයන්, ජනතා නියෝජිතයන් සහ රටෙහි මහජන මුදල් භාවිතය සියුම් ලෙස පිරික්සන්නන් ලෙස සිය කාර්යයන් සඵලදායී සහ වඩා කාර්යක්ෂම ලෙසින් ඉටු කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට උපකාරී වන කාර්යය පටිපාටිමය උපදෙස් සහ පහසුකම් සැපයීම.

## 2. ප්‍රධාන කාර්යයන්

(i) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීම
(ii) රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පූර්ණ පාලනය ක්‍රියාත්මක කිරීම
(iii) විධායකය සම්බන්ධයෙන් අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම

## 3. සංවිධාන ව්‍යුහය

ගරු කථානායකතුමා ප්‍රමුඛත්වය දරන පාර්ලිමේන්තුවේ රාජකාරි කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යවන ලේකම් සහ කාර්ය මණ්ඩල සේවාවන් සැපයීම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යාලය පහත සඳහන් දෙපාර්තමේන්තු වලින් සමන්විත වේ.

**( සංවිධාන ව්‍යුහය සඳහා කරුණාකර ඇමුණුම 01 බලන්න )**

1. වේත්‍රධාරී දෙපාර්තමේන්තුව
2. පරිපාලන දෙපාර්තමේන්තුව
3. ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව
4. හැන්සාඩ් දෙපාර්තමේන්තුව
5. සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව
6. මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව
7. ආහාරපාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව
8. තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව

## 3.1 වේත්‍රධාරී දෙපාර්තමේන්තුව

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නියමිත වේලාවට හා කාර්යක්ෂම අයුරින් පහත දැක්වෙන සේවාවන් හැකි ඉහළම අයුරින් සැපයීම මගින් පාර්ලිමේන්තුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැපයීම :-

- උත්සව රාජකාරි, පාර්ලිමේන්තු සභාගර්භය තුළ විනය පවත්වාගෙන යාම, සෙංකෝලයේ භාරකාරත්වය හා ආරක්ෂාව, පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට අමුත්තන් ඇතුළු කිරීම සහ ගැලරි අධීක්ෂණය.

- පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සංරක්ෂණය සහ පාර්ලිමේන්තු සංකීර්ණය තුළ ඉඩකඩ වෙන් කිරීම.

- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ජොෂ්ඨතා ලේඛන පිළියෙල කිරීම, පාර්ලිමේන්තු සභා ගර්භයෙහි ආසන වෙන් කිරීම සහ ආසන සැලැස්ම මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

## 3.2 පරිපාලන දෙපාර්තමේන්තුව

- නීති සම්පාදනය, අධීක්ෂණය හා මහජන මුදල් පාලනය උදෙසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය සපුරාලනු වස් ඔවුන් හට කාර්යක්ෂම සහ උසස් තත්වයේ සේවයක් ලබා දීම පිණිස වඩාත් සුදුසු සාමාජිකයින් කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම, උසස් කිරීම හා විනය සම්බන්ධ කටයුතු ඇතුළුව කාර්ය මණ්ඩලයේ සියලුම අංශ වල සාමාජිකයින්ගේ දැනුම, හැකියාවන් සහ ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් කළමණාකරණය, භාෂා ප්‍රවීණතා, පරිගණක, සූපවේදී, ගිණුම්කරණ, පුස්තකාල සේවා වැනි විෂයානුබද්ධ දේශීය සහ විදේශීය පුහුණු පාඨමාලා සංවිධානය කිරීම සහ කාර්ය මණ්ඩලයේ ධනාත්මක ආකල්ප වර්ධනය තුලින් ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස වැඩසටහන් සංවිධානය කිරීම සම්බන්ධ කටයුතු පරිපාලන දෙපාර්තමේන්තුවෙන් ඉටු කරනු ලැබේ.

- මීට අමතරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිය ධුරවල කටයුතු ඉටු කිරීම සඳහා අනුමත පහසුකම් හා සේවාවන් ගුණාත්මක භාවයෙන් සහ කඩිනමින් ලබා දීමට කටයුතු කිරීමත්, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ප්‍රවාහනය සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීමත් පරිපාලන දෙපාර්තමේන්තුව මගින් කරනු ලබයි. පහත සඳහන් අංශ පරිපාලන දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා සිය දායකත්වය සපයයි :-

1. ආයතන කාර්යාංශය

2. මන්ත්‍රී සේවා කාර්යාංශය

3. ප්‍රවාහන කාර්යාංශය.

## 3.3 හැන්සාඩ් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු රැස්වීම්, පාර්ලිමේන්තු කාරක සභා, සම්මන්ත්‍රණ, පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගම් සහ අන්තර් පාර්ලිමේන්තු සංගම් සම්මන්ත්‍රණ අපක්ෂපාතීව, නිවැරදිව හා කලට වේලාවට වාර්තා කිරීම, සුවිගත කිරීම සහ ශ්‍රව්‍ය වාර්තාකරණයන් අධීක්ෂණය සහතික කරයි.

## 3.4 සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව

- ජාතික වටිනාකමකින් යුත් සුවිශේෂී පොදු දේපළක් ලෙස පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සුරක්ෂිත කිරීම හා එය ඵලදායී සහ කාර්යක්ෂම ආකාරයෙන් නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම තහවුරු කිරීම සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

- භෞතික යටිතල පහසුකම් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ කාර්ය මණ්ඩලය සඳහා නවීන පහසුකම් සහිත කාර්යක්ෂම සේවා පරිසරයක් සැපයීම.

## 3.5 ආහාරපාන සහ ගෘහ පාලන දෙපාර්තමේන්තුව

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, කාර්ය මණ්ඩලය සහ අමුත්තන් සඳහා ආහාරපාන සැපයීම.

- ආපනශාලා සහ මුළුතැන්ගෙය කළමනාකරණය.

- ගොඩනැගිල්ලේ අභ්‍යන්තර හා බාහිර අලංකරණ කටයුතු, පවිත්‍රතා කටයුතු හා අනෙකුත් නඩත්තු කටයුතු .

## 3.6 මුදල් සහ සැපයුම් දෙපාර්තමේන්තුව

- අයවැය සකස් කිරීම සහ වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් එකතු කිරීම හා අයවැය පාලනය; ගිණුම්කරණය, අවසන් ගිණුම් වාර්තා සකස් කිරීම.

- පාර්ලිමේන්තුවට අවශ්‍යකරන ද්‍රව්‍ය මිලදී ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා ප්‍රසම්පාදන කටයුතු පරිපාලනය කිරීම.

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, විශ්‍රාමික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, කාර්ය මණ්ඩලයට සහ විශ්‍රාමිකයින්ට, අනියම් සහ සහන සේවකයිනට වැටුප් හා දීමනා ගෙවීම

- සැපයුම් කරුවන්ට හා සේවා සපයන ආයතන වලට අදාල ගෙවීම් කිරීම.

මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ පහත සඳහන් අංශ ක්‍රියාත්මක වේ:-

1. මුදල් සහ ගිණුම් කාර්යාංශය
2. සැපයුම් හා සේවා කාර්යාංශය
3. ආහාරපාන ගිණුම් කාර්යාංශය

## 3.7 ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව

නීති සම්පාදනය, අධීක්ෂණය හා මහජන මුදල් යන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීමය සේවාවන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත සපයයි.

පහත සඳහන් අංශ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ:-

1. සභා ලේඛන කාර්යාංශය
2. පනත් කෙටුම්පත් කාර්යාංශය
3. කාරක සභා කාර්යාංශය
4. උපදේශක කාරක සභා කාර්යාංශය
5. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා සහ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභා කාර්යාංශය
6. මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශය
7. කථා පරිවර්තක කාර්යාලය
8. පුස්තකාලය.

## 3.8 තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව

තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම, අන්තර්ජාල සම්බන්ධතාවන් වැඩිදියුණු කිරීම, පාර්ලිමේන්තු අන්තඃජාලය කාර්යක්ෂම හා ඵලදායි ලෙස පවත්වාගෙන යාම සහ කළමනාකරණය, පාර්ලිමේන්තුවේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපකරණ නඩත්තුව මගින්;

- පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ සියලු තොරතුරු තාක්ෂණ පාදක පරිපාලන ක්‍රියාකාරකම් ඉටු කිරීම.

- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මෙවලම් භාවිතා කරමින් පූර්ණ සමෝධානිත තොරතුරු පද්ධතියක් මගින් පාර්ලිමේන්තුව ආශ්‍රිත වැදගත් ප්‍රස්තුතයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.

## 3.9 **විදේශ සබඳතා හා සන්ධාන කාර්යාංශය හා අභ්‍යන්තර විගණන අංශය සෘජුවම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.**

# 4. කාර්ය මණ්ඩල තොරතුරු

2015 වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව පහත දැක්වේ

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | | | | දැනට සිටින සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පා.ම.ලේ. | ගරු. කථානායකතුමා | ගරු. නියෝජ්‍ය කථානායකතුමා | ගරු.නි.කාරක සභාපතිතුමා | පා.ම.ලේ. | ගරු. කථානායකතුමා | ගරු. නියෝජ්‍ය කථානායකතුමා | ගරු.නි.කාරක සභාපතිතුමා |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 106 | 0 | 0 | 0 | 100 | 0 | 0 | 0 |
| තෘතීය මට්ටම | 138 | 0 | 0 | 0 | 106 | 0 | 0 | 0 |
| ද්විතීයික මට්ටම | 276 | 0 | 0 | 0 | 191 | 0 | 0 | 0 |
| ප්‍රාථමික මට්ටම | 524 | 0 | 0 | 0 | 484 | 0 | 0 | 0 |
| අනියම් / තාවකාලික | | 44 | 21 | 21 | | 44 | 21 | 17 |
| එකතුව (2015.12.31 දිනට) | 1044 | 44 | 21 | 21 | 881 | 44 | 21 | 17 |

2015 වර්ෂය තුළදී පාර්ලිමේන්තුවේ විවිධ තනතුරු සඳහා සේවකයින් 8 දෙනෙකු බඳවාගන්නා ලදී.

# 5. කාර්ය සාධනය

## 5.1 මූල්‍ය පරිපාලනය - 2015 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන වලින් කරන ලද වියදම් :-

2015 වර්ෂයේ මෙහෙයුම් වැඩසටහන් අංක 01 සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ලෙස වෙන්කරන ලද ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන වැය කළ ආකාරය පහත දැක්වේ :-

ඩී.පී.එස්.ඒ - 1

### විසර්ජන ගිණුම 2015

වියදම් ශීර්ෂ අංකය:16

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.පී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | | | | | | | |
| 01 | ගරු කථානායකතුමාගේ කාර්යාලය | 116,600,000 | 0 | 18,000,000 | 134,600,000 | 116,885,839 | 17,714,161 | 5 |
| 02 | සාමාන්‍ය පරිපාලනය | 1,015,800,000 | 105,000,000 | 22,000,000 | 1,142,800,000 | 1,100,837,736 | 41,962,264 | 5 |
| 03 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පහසුකම් සැපයීම | 540,100,000 | 10,000,000 | -40,000,000 | 510,100,000 | 455,165,047 | 54,934,953 | 5 |
| | උප එකතුව (පුනරාවර්තන) | 1,672,500,000 | 115,000,000 | 0 | 1,787,500,000 | 1,672,888,622 | 114,611,378 | 4 |
| | මූලධන | | | | | | | |
| 01 | ගරු කථානායකතුමාගේ කාර්යාලය | 8,350,000 | | 0 | 8,350,000 | 5,999,662 | 2,350,338 | 6 |
| 02 | සාමාන්‍ය පරිපාලනය | 53,500,000 | 5,000,000 | 0 | 58,500,000 | 47,474,844 | 11,025,156 | 7 |
| 03 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පහසුකම් සැපයීම | 6,000,000 | 0 | 0 | 6,000,000 | 5,316,500 | 683,500 | 8 |
| | උප එකතුව (මූලධන) | 67,850,000 | 5,000,000 | 0 | 72,850,000 | 58,791,006 | 14,058,994 | 4 |
| | මුළු එකතුව | 1,740,350,000 | 120,000,000 | 0 | 1,860,350,000 | 1,731,679,628 | 128,670,372 | 4 |

පිටු අංක. 4 සිට 30 දක්වා ඩී.පී.එස්.ඒ 2 සිට ඩී.පී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ සටහන් පිටු අංක 31 සිට 34 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට සහතුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :
ඩබ්ලිව්. බී. ඩී. දසනායක
පාර්ලිමේන්තුවේ මහ ලේකම්
පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ.

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 23.03.2016
කේ. පී. මර්වින් ජයශාන්ත
අධ්‍යක්ෂ (මුදල්)
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

ඩී.පී.එස්.ඒ - 2

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම - 2015

වියදම් ශීර්ෂ අංකය: 16 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.පී.එස්.ඒ ආකෘති යොමුව සමඟ) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.පී.එස්.ඒ ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.පී.එස්.ඒ. 3) | 1,672,500,000 | 115,000,000 | 0 | 1,787,500,000 | 1,672,888,622 | 114,611,378 | 5 |
| (ආ) මූලධන (ඩී.පී.එස්.ඒ. 4) | 67,850,000 | 5,000,000 | 0 | 72,850,000 | 58,791,006 | 14,058,994 | 6 - 8 |
| එකතුව | 1,740,350,000 | 120,000,000 | 0 | 1,860,350,000 | 1,731,679,628 | 128,670,372 | |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:- 28.03.2016

ඩී.පී.එස්.ඒ - 3

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපෘති අංකය. 01 ගරු කථානායකතුමාගේ කාර්යාලය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 45,800,000 | 0 | 0 | 45,800,000 | 44,178,010 | 1,621,990 |
| අනෙකුත් වියදම් | 70,800,000 | 0 | 18,000,000 | 88,800,000 | 72,707,829 | 16,092,171 |
| උප එකතුව | 116,600,000 | 0 | 18,000,000 | 134,600,000 | 116,885,839 | 17,714,161 |
| ව්‍යාපෘති අංක 02 සාමාන්‍ය පරිපාලනය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 594,700,000 | 105,000,000 | | 699,700,000 | 692,054,274 | 7,645,726 |
| අනෙකුත් වියදම් | 421,100,000 | | 22,000,000 | 443,100,000 | 408,783,462 | 34,316,538 |
| උප එකතුව | 1,015,800,000 | 105,000,000 | 22,000,000 | 1,142,800,000 | 1,100,837,736 | 41,962,264 |
| ව්‍යාපෘති අංක 03 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පහසුකම් සැපයීම. | | | | | | |
| පුද්ගල පඩිනඩි | 87,000,000 | | | 87,000,000 | 85,619,994 | 1,380,006 |
| අනෙකුත් වියදම් | 453,100,000 | 10,000,000 | -40,000,000 | 423,100,000 | 369,545,053 | 53,554,947 |
| උප එකතුව | 540,100,000 | 10,000,000 | -40,000,000 | 510,100,000 | 455,165,047 | 54,934,953 |
| | | | | | | |
| මුළු එකතුව | 1,672,500,000 | 115,000,000 | 0 | 1,787,500,000 | 1,672,888,622 | 114,611,378 |

2016. 03. 28

ඩී.පී.එස්.ඒ - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

ව්‍යාපෘති අංකය හා නාමය: 01 ගරු කථානායකතුමාගේ කාර්යාලය

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාශ්‍රය (සංකේත අංකය) | අයිතම විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,000,000 | 0 | 0 | 3,000,000 | 2,071,255 | 928,745 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 139,095 | 360,905 |
| 2003 | | 11 | වාහන | 3,500,000 | 0 | 0 | 3,500,000 | 3,417,900 | 82,100 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | | | | | | |
| 2101 | | 11 | වාහන | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 1,000,000 | 0 | 0 | 1,000,000 | 22,500 | 977,500 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 350,000 | 0 | 0 | 350,000 | 348,912 | 1,088 |
| | | | එකතුව | 8,350,000 | 0 | 0 | 8,350,000 | 5,999,662 | 2,350,338 |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:- 2016.03.28

ඩී.පී.එස්.ඒ - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

ව්‍යාපෘති අංකය හා නාමය: 02 සාමාන්‍ය පරිපාලනය

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාශ්‍රය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 4,500,000 | 0 | | 4,500,000 | 3,919,458 | 580,542 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 15,000,000 | 0 | | 15,000,000 | 14,635,298 | 364,702 |
| 2003 | | 11 | වාහන | 1,500,000 | 0 | | 1,500,000 | 250,361 | 1,249,639 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | | | | | | |
| 2101 | | 11 | වාහන | 0 | 0 | | 0 | 0 | 0 |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 9,000,000 | 0 | | 9,000,000 | 2,125,104 | 6,874,896 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 21,000,000 | 5,000,000 | | 26,000,000 | 24,736,681 | 1,263,319 |
| | | | මානව සම්පත් සංවර්ධනය | | | | | | |
| 2401 | | 11 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 2,500,000 | 0 | | 2,500,000 | 1,807,942 | 692,058 |
| | | | එකතුව | 53,500,000 | 5,000,000 | 0 | 58,500,000 | 47,474,844 | 11,025,156 |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:- 2016.03.28

ඩී.ජී.එස්.ඒ - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 16

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : පාර්ලිමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් කටයුතු

ව්‍යාපෘති අංකය හා නාමය: 03 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන් සඳහා පහසුකම් සැපයීම

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාශ්‍රය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම | 5,000,000 | 0 | 0 | 5,000,000 | 4,892,100 | 107,900 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | | | | | | |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 0 | 500,000 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 424,400 | 75,600 |
| | | | එකතුව | 6,000,000 | 0 | 0 | 6,000,000 | 5,316,500 | 683,500 |

ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:- 2016.03.28

**රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම :-**

2015 වර්ෂය අවසානයේදී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ අනුමත සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ:-

| විස්තර | 2015 අනුමත සීමා (රු.) | 2015 තථ්‍ය අගයන් (රු.) | |
|---|---|---|---|
| වියදම්වල උපරිම සීමා | 39,340,000 | 01601-1 | 26,140,890.79 |
| | | 01601-2 | 330,800.00 |
| ලැබීම්වල අවම සීමා | 28,340,000 | 01601-1 | 34,149,758.61 |
| | | 01601-2 | 132,336.00 |
| උපරිම හර ශේෂය | 175,000,000 | 127,417, 213.46 | |

## 5.2 කාරක සභා:-

2015 ජූනි මස 26 වැනි දින හත්වැනි පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. එබැවින් කාරක සභා පිළිබඳ සමාලෝචනය කිරීමේදී 2015 ජනවාරි මස 01.දින සිට එදින දක්වාත්, අභිනව 8 වන පාර්ලිමේන්තුව ආරම්භ වූ 2015 සැප්තැම්බර් මස 01 දින සිට දෙසැම්බර් මස 31 දක්වාත් කාර්ය සාධනයට අදාළ විස්තර වෙන් වෙන් වශයෙන් අන්තර්ගත කර ඇත.

### 5.2.1 උපදේශක කාරක සභා :

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක: 104 ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන උපදේශක කාරක සභා සංඛ්‍යාවක් පත් කරන ලද අතර එක් එක් විෂයය භාර අමාත්‍යවරයා අදාළ කාරක සභාවේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී. 2015 වර්ෂය තුළ උපදේශක කාරක සභා රැස්වීම් 13 ක් පවත්වා ඒ පිළිබඳ වාර්තාව 2015 මැයි මස පාර්ලිමේන්තුවට පිළිගන්වා ඇත.

2015 වර්ෂය තුළදී පවත්වන ලද රැස්වීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනුක්‍රමික අංකය | උපදේශක කාරක සභාවේ නම | පැවැත්වූ රැස්වීම් ගණන |
|---|---|---|
| 01 | නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවාහන | 01 |
| 02 | මුදල් | 02 |
| 03 | සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන | 01 |
| 04 | මහජන සාමය හා ක්‍රිස්තියානි කටයුතු | 02 |
| 05 | අධ්‍යාපන | 01 |
| 06 | ඉඩම් | 01 |
| 07 | ආහාර සුරක්ෂිතතාව | 01 |
| 08 | ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු | 01 |
| 09 | වරාය හා නාවික | 01 |
| 10 | ස්වදේශ කටයුතු | 01 |
| 11 | විදේශ රැකියා | 01 |
| | **එකතුව** | **13** |

## 5.2.2 විශේෂ කාර්යයන් සඳහා වූ කාරක සභා :

**(i)** **තේරීම් කාරක සභාව :**

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක: 121 යටතේ තේරීම් කාරක සභාව පත් කරනු ලැබේ. හත්වන පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාව ගරු කථානායකතුමාගේ සභාපතිත්වය යටතේ සාමාජිකයින් 18 දෙනෙකුගෙන් සමන්විත වූ අතර 2015 වර්ෂය තුළ කාරක සභාවේ රැස්වීම් වාර 03 ක් පවත්වා ඇත. අටවැනි පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාව ගරු කථානායකතුමාගේ සභාපතිත්වය යටතේ සාමාජිකයින් 20 දෙනෙකුගෙන් සමන්විත වූ අතර 2015 වර්ෂය තුළදී එක් රැස්වීමක් පමණක් පවත්වා ඇත.

**(ii)** **වරප්‍රසාද පිළිබඳ කාරක සභාව :**

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක: 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව පත් කරනු ලැබේ.

2015 වර්ෂය තුළදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීම් පිළිබඳව විමර්ශනය කිරීම පිණිස වන ඉහත කාරක සභාවේ එක් රැස්වීමක් පවත්වා ඇත.

**(iii)** **උසස් නිලතල පිළිබඳ කාරක සභාව:**

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 128 (අ) යටතේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව පත් කරනු ලැබේ.

හත්වන පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව ගරු රත්නසිරි වික්‍රමනායක මහතාගේ සභාපතිත්වය යටතේ සාමාජිකයින් 17 දෙනෙකුගෙන් සමන්විත වූ අතර රැස්වීම් 06 ක් පවත්වා තානාපති / මහකොමසාරිස් වරුන් 33 දෙනෙකුගේද, අමාත්‍යාංශ ලේකම්වරු 9 දෙනෙකුගේද සුදුසුකම් පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ගරු කරු ජයසූරිය මහතාගේ සභාපතිත්වයෙන් යුත් සාමාජිකයින් 13 දෙනෙකුගෙන් යුත් අටවන පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව 2015 වර්ෂය තුළදී රැස්වීම් වාර 03 ක් පවත්වා ඇති අතර, තානාපතිවරුන් / මහ කොමසාරිස්වරුන් 05 දෙනෙකුගේද, එක් අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේද යෝග්‍යතාව පරීක්ෂාකර බලා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

**(iv)** **ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව:**

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 123 යටතේ පත්කරනු ලබන ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව ගරු කථානායකතුමාගේ සභාපතීත්වය යටතේ ක්‍රියාත්මක වේ. 2015 වර්ෂයේ හත්වන පාර්ලිමේන්තු කාල සීමාව තුල මෙම කාරක සභාවේ රැස්වීම් වාර 02 ක් පවත්වා ඇති අතර අටවන පාර්ලිමේන්තු කාල සීමාව තුල එක් රැස්වීමක් පවත්වා ඇත.

**(v)** **රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව**

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2015 වර්ෂය තුල පහත සඳහන් ආයතන වල ගිණුම් පිළිබඳව වූ වාර්තා විමර්ශනය කර 2015 පෙබරවාරි මස 10 වන දින සහ 2015 මැයි මස 19 වන දින පාර්ලිමේන්තුවට සිය වාර්තා ඉදිරිපත් කර ඇත.

**2015 වර්ෂයේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතන**

| අංක: | ආයතනයේ නම | විමර්ශනය කළ දිනය |
|---|---|---|
| 01 | සේවක අර්ථ සාධක අරමුදල | 09.06.2015 |
| 02 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 10.06.2015 |
| 03 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 11.06.2015 |

ඉහත විමර්ශනය කිරීම් වලට අමතරව 8 වන පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ රැස්වීම් සහ වැඩ මුළු සංවිධානය කරන ලදී.

**(vi) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව :**

2015 වර්ෂයේ මුල් කාර්තුව තුල 2014 වර්ෂය අග භාගයේදී කාරක සභාව විසින් සළකා බලන ලද ආයතන වල කාර්ය සාධනය සහ වර්තමාන කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට අදාළ කටයුතු කළ අතර ප්‍රධාන කමිටුවට අමතරව එහි තුන්වන අනු කාරක සභාව සහ විශේෂ අනු කාරක සභාව විසින් විමර්ශනය කළ ආයතන පිළිබඳ වාර්තාවක් 2015 අප්‍රේල් මස 09 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

<u>තුන්වන අනු කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතන</u>

| අංක | ආයතනයේ නම | විමර්ශනය කල දිනය |
|---|---|---|
| 01 | තැනැත්තන්, දේපල සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය | 04.03.2015 |
| 02 | රණවිරු සේවා අධිකාරිය | 06.03.2015 |
| 03 | උද්භිද උද්‍යාන භාරකාර අරමුදල | 06.03.2015 |

<u>විශේෂ අනු කාරක සභාවක් විසින් විමර්ශනය කරන ලද ආයතන</u>

| අංක | ආයතනයේ නම | විමර්ශනය කල දිනය |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා මහ බැංකුව | 26.05.2015 |
| 02 | ශ්‍රී ලංකා මහ බැංකුව | 29.05.2015 |
| 03 | ශ්‍රී ලංකා මහ බැංකුව | 03.06.2015 |
| 04 | ශ්‍රී ලංකා මහ බැංකුව | 04.06.2015 |
| 05 | ශ්‍රී ලංකා මහ බැංකුව | 05.06.2015 |
| 06 | ශ්‍රී ලංකා මහ බැංකුව | 09.06.2015 |
| 07 | ශ්‍රී ලංකා මහ බැංකුව | 10.06.2015 |
| 08 | ශ්‍රී ලංකා මහ බැංකුව | 10.06.2015 |
| 09 | ශ්‍රී ලංකා මහ බැංකුව | 11.06.2015 |
| 10 | ශ්‍රී ලංකා මහ බැංකුව | 17.06.2015 |
| 11 | ශ්‍රී ලංකා මහ බැංකුව | 18.06.2015 |
| 12 | ශ්‍රී ලංකා මහ බැංකුව | 23.06.2015 |

මීට අමතරව හත්වන පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් අනතුරුව 8 වන පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට සභාපතිවරයෙක් පත් කිරීම , කාරක සභාවේ ඉදිරි වැඩපිළිවෙල ගැන සාකච්ඡා කිරිම සහ ඒ පිලිබඳව දැනුවත් කිරීමේ වැඩ මුළු පැවැත්වීම සිදුකර ඇත.

**(vii) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව :**

රාජ්‍ය ආයතන වල ක්‍රියාකාරීත්වය තුල නිලධාරීන් විසින් සමහර අවස්ථාවලදී ගනු ලබන තීරණ අසාධාරණ හෝ අයුක්තිසහගත වූ අවස්ථාවක අගතියට පත් වන මහජනතාවට සහනයක් ලබා ගැනීම පිණිස සිය දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තු ක්‍රියාදාමය තුළ පිහිටුවා ඇති වැදගත් ස්ථානය මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවයි.

2015 වර්ෂයේ 7 වන පාර්ලිමේන්තු කාල සීමාවට අදාළව කාරක සභාවේ පළමු රැස්වීම 2015.02.18 දින පවත්වා ඇති අතර 2015.06.26 දින 7 වන පාර්ලිමේන්තුව විසුරුවා හරින අවස්ථාව වන විට රැස්වීම් 16 ක් පවත්වා තිබිණි.

8 වන පාර්ලිමේන්තුවේ පළමු සභා වාරය සඳහා පළමු රැස්වීම 2015.12.02 දින පවත්වන ලදී. 8 වන පාර්ලිමේන්තුව ආරම්භ වීමත් සමඟ පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්ය පටිපාටිය හා ඒ සම්බන්ධව ඇති වගකීම පිළිබඳව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

පෙත්සම් කාරක සභාවේ කාර්යයන් පිළිබඳව දළ අංසශෝධිත සංඛ්‍යාත්මක දත්ත පහත පරිදි වේ.

**<u>7 වන පාර්ලිමේන්තුවේ 2015.01.01 දින සිට 2015.06.26 දින දක්වා</u>**

| | |
|---|---|
| කාරක සභාවට ලැබී ඇති මුළු පෙත්සම් ගණන | 166 |
| ස්ථාවර නියෝග වලට අනනුකූල වීම හේතුවෙන් ප්‍රතික්ෂේප කරන ලද පෙත්සම් සංඛ්‍යාව | 23 |
| කථානායකතුමාගේ අනුමැතියට යොමු කර ඇති පෙත්සම් ගණන<br>(2014 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුල ලැබී ඇති පෙත්සම් ද ඇතුළුව) | 247 |
| පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති පෙත්සම් ගණන | 378 |
| ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කර ඇති පෙත්සම් ගණන | 71 |
| කාරක සභාව විසින් අමාත්‍යාංශ වෙත යොමු කර ඇති පෙත්සම් ගණන | 307 |
| කාරක සභාව සලකා බලා ඇති පෙත්සම් ගණන ( කාරක සභා 16 ක දී) | 192 |
| සහන ලබා දි ඇති පෙත්සම්කරුවන් ගණන | 11 |
| අවසන් කර ඇති පෙත්සම් ගොනු ගණන (සහන ලබා දී/නොදී) | 68 |

**8 වන පාර්ලිමේන්තුවේ 2015.09.01 දින සිට 2015.12.31 දින දක්වා**

| | |
|---|---|
| කාරක සභාවට ලැබී ඇති මුළු පෙත්සම් ගණන | 589 |
| ස්ථාවර නියෝග වලට අනනුකූල වීම හේතුවෙන් ප්‍රතික්ෂේප කරන ලද පෙත්සම් සංඛ්‍යාව | 179 |
| කථානායකතුමාගේ අනුමැතියට යොමු කර ඇති පෙත්සම් ගණන (2014 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුල ලැබී ඇති පෙත්සම් ද ඇතුළුව) | 359 |
| පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති පෙත්සම් ගණන | 254 |

## 5.2.3 විශේෂ කාරක සභා :

(i) **2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව**

2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් පහත සඳහන් අමාත්‍යාංශ 17 පිළිබඳ වැය ශීර්ෂයන් සාකච්ඡා කිරීම සඳහා ගරු මහින්ද සමරසිංහ මහතාගේ සභාපතිත්වයෙන් යුක්තව පත් කරන ලද මෙම කාරක සභාව මන්ත්‍රීවරු 21 දෙනෙකුගෙන් සමන්විත විය.

1. බුද්ධ ශාසන
2. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන
3. සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු
4. නිපුනතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු
5. ස්වදේශ කටයුතු
6. ආපදා කළමනාකරණ
7. තිරසර සංවර්ධන හා වන ජීවී
8. විශේෂ කාර්යභාර
9. තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු
10. විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම්
11. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ
12. ජාතික සංවාද
13. වැවිලි කර්මාන්ත
14. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු
15. ප්‍රාථමික කර්මාන්ත
16. ග්‍රාමීය ආර්ථික කටයුතු
17. කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන

2015 දෙසැම්බර් 04 වැනි දින ආරම්භ කොට 2015දෙසැම්බර් 14 වැනි දින දක්වා කාරක සභාව රැස්වීම් 07 ක් පවත්වා ඇත.

ගරු අමාත්‍යවරුන්, අදාළ අමාත්‍යාංශ වල නියමු නිලධාරින් සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් ඉහත කාරක සභාවේ රැස්වීම් වලට සහභාගී වූ අතර 2015 දෙසැම්බර් මස 16 වැනි සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

## තත්කාර්ය කාරක සභා

### පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය

හත්වන පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය ගරු සුමේධා ජී. ජයසේන මහත්මියගේ සභාපතිත්වයෙන් යුක්ත වූ අතර සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් සාමාජිකත්වය දරනු ලැබීය.

2015 වර්ෂයේ හත්වන පාර්ලිමේන්තුවේ පලමු සැසි වාරය තුළ මෙම කාරක සභාව රැස්වීම් 04 ක් පවත්වා ඇත.

2015 වර්ෂයේ ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් 2015 මාර්තු මස 07 වන දින සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විදේශ තානාපතිවරුන් සහ රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් විශේෂ සමුළුවක් පවත්වන ලදී.

8 වන පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය ගරු චන්ද්‍රාණි බණ්ඩාර මහත්මියගේ සභාපතිත්වයෙන් 2015 වසර තුලදී රැස්වීම් තුනක් පවත්වා ඇත.

### ළමයින් සඳහා වූ පාර්ලිමේන්තු සංසදය

හත්වන පාර්ලිමේන්තුවේ ළමයින් සඳහා වූ පාර්ලිමේන්තු සංසදයේ සභාපතිත්වය ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් දරන ලද අතර ගරු මන්ත්‍රීවරුන් 17 දෙනෙකු සාමාජිකත්වය දරන ලදී. මෙම කාල සීමාව තුල සංසදයේ එක් රැස්වීමක් පවත්වා ඇත.

අටවන පාර්ලිමේන්තුවේද ළමයින් සඳහා වූ පාර්ලිමේන්තු සංසදයේ සභාපතිත්වය ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් දරනු ලබන අතර 2015 දෙසැම්බර් මස 31 දින වන විට රැස්වීම් තුනක් පවත්වා ඇත.

### 5.3 පනත් කෙටුම්පත් කාර්යාංශය :

- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම සකස් කිරීම, සැසඳීම සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කටයුතු මෙම කාර්යාංශය මඟින් 2015 වර්ෂය තුළ දී සිදුකරන ලදි.

- 2015 වර්ෂය තුළ දී රජයේ පනත් කෙටුම්පත් ගැසට් 33 ක් මෙම කාර්යාංශයට ලැබුනු අතර පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ගැසට් 80 ක් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. පාර්ලිමේන්තුවේදී සම්මත වීමෙන් අනතුරුව ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කරන ලද පනත් කෙටුම්පත් සංඛ්‍යාව 17 කි. (රජයේ පනත් කෙටුම්පත් 16 ක් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන 01 ක් මීට ඇතුලත් විය.)

  **(2015 වසරේ පනත් ලේඛනය සඳහා කරුණාකර ඇමුණුම 02 බලන්න.)**

- 2015 වසර තුළදී ස්ථාවර කාරක සභා වෙත යොමු කළ පනත් කෙටුම්පත්, ප්‍රඥප්ති කෙටුම්පත් පිළිබඳව සලකා බැලීම සඳහා වූ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා රැස්වීම් 04 ක් පවත්වා ඇති අතර එම කාරක සභා මගින් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සලකා බලා ඇත.

උක්ත කටයුතු වලට අමතරව පහත සඳහන් කටයුතු ද 2015 වර්ෂය තුළ දී පනත් කෙටුම්පත් කාර්යාංශය මඟින් ඉටුකර ඇත.

අ) 2015 වර්ෂයේ සම්මත කරන ලද 19 වන ව්‍යවස්ථා සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කොට භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කොට සංශෝධන සියල්ල ඇතුළත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වශයෙන් මුද්‍රණය කිරීමට සැලැස්වීම.

ආ) පාර්ලිමේන්තු අන්තඃජාලයේ ඇති ව්‍යවස්ථාදායක සේවා තොරතුරු පාර්ලිමේන්තු වෙබ් අඩවිය හරහා මහජනතාවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට භාෂා තුනෙන්ම ලබා ගැනීමට හැකිවනු පිණිස අවශ්‍ය පහසුකම් සැලසීම.

ඇ) පනත් කෙටුම්පත්වලට අදාළව ව්‍යවස්ථාදායක සේවා තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම.

ඈ) 2015 වර්ෂයේ සම්මත වූ සියලුම පනත් ගොනුකොට පොතක් වශයෙන් බැඳීමට අවශ්‍ය කටයුතු සැලසීම.

ඉ) මන්ත්‍රීවරුන්, අමාත්‍යාංශ, පළාත් සභා සහ විවිධ ආයතනයනවල ඉල්ලීම් මත පනත් කෙටුම්පත්/පනත් පිළිබඳව සහ ඒවා සම්මත කිරීමේ ක්‍රියාදාමයන්ට අදාළව තොරතුරු ලබාදීම ද පනත් කෙටුම්පත් කාර්යාංශය මඟින් පසුගිය වසර තුළදී ද සිදු කරන ලදී.

## 5.4 සභාලේඛන කාර්යාංශය:

පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට අදාළ සභාවේ සියලු කටයුතු කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස ඉටුකිරිමට අවශ්‍ය සහාය ලබා දීම සභාලේඛන කාර්යාංශයේ මෙහෙවරයි.

2015 වර්ෂය තුළ දී හත්වැනි පාර්ලිමේන්තුවට අදාළව රැස්වීම් 41 ක් සහ 8 වැනි පාර්ලිමේන්තුවට අදාලව රැස්වීම් 41 ක් වශයෙන් පාර්ලිමේන්තු රැස්වීම් 82 ක් පවත්වා ඇත.

ඉහත පාර්ලිමේන්තු රැස්වීම්වලට අදාළව පහත සඳහන් ක්‍රියාකාරකම් සභාලේඛන කාර්යාංශය විසින් 2015 වර්ෂය තුළ සිදු කර ඇත :-

i) ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත යෝජනා සහ ප්‍රශ්න ඇතුළත් න්‍යාය පුස්තක 3 ක් හා ඒ හා අනුබද්ධිත පරිපූරක 38 ක් ද, පාර්ලිමේන්තුවේ රැස්වීම් 82 ක් වෙනුවෙන් න්‍යාය පත්‍ර සහ කාර්ය සටහන්ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සකස් කර මුද්‍රණය කරන ලදී.

ii) එකී මුද්‍රිත න්‍යාය පුස්තක හා ඒ හා අනුබද්ධිත පරිපූරක සහ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍ර අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් ඇතුළුව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අමාත්‍යාංශ ලේකම්වරුන් සහ වෙනත් අදාළ ආයතන ප්‍රධානීන් වෙත දේශීය අධිවේගී තැපැල් සේවය මඟින් විධිමත් ලෙස බෙදා හැරීමටත් සභා මේස මත තැබීමටත් කටයුතු කරන ලදී .

iii) අමාත්‍යාංශ, ඒවායේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළව ඒ ඒ අමාත්‍යාංශවලින් එවන ලද කාර්ය සාධන සහ වාර්ෂික වාර්තා 425 ක් ද, විවිධ පනත් යටතේ සකස් කර ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග, රෙගුලාසි සහ නියාමයන් අඩංගු යෝජනාද, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

iv) හත්වන පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් විසින් භාර දෙන ලද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 277 ක් සහ අටවන පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 400 ක් වශයෙන් මුළු ප්‍රශ්න 677 ක් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව සංස්කරණය කර භාෂාත්‍රයෙන්ම න්‍යාය පුස්තකයට ඇතුළත් කිරීමට කටයුතු කරන ලදී .

v) හත්වන සහ අටවන පාර්ලිමේන්තු වල මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා 160 ක් සහ දින නියමයක් නොමැති යෝජනා 3 ක් භාරගෙන සංස්කරණය කර භාෂාත්‍රයෙන්ම න්‍යාය පුස්තකයට ඇතුළත් කිරීමට කටයුතු කටයුතු කරන ලදී.

vi) හත්වන පාර්ලිමේන්තුවට අදාළව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම් 32 ක්ද, අටවන පාර්ලිමේන්තුවට අදාළව එම කාරක සභාවේ රැස්වීම් 13 ක් කැඳවා, ඒ පිළිබඳ කාර්ය සටහන් භාෂාත්‍රයෙන්ම නිකුත් කිරීමට කටයුතු කිරීම සහ එකී තීරණවලට අදාළ පසුවිපරම් කටයුතු කිරීම මෙම කාර්යාංශය විසින් ඉටු කර ඇත. තවද 2015 වර්ෂයේ 8 වන පාර්ලිමේන්තු කාල සීමාවට අදාළව පක්ෂ නායක රැස්වීම් 02 ක් පවත්වා ඇත.

vii) ජනාධිපතිවරයාගෙන් ලැබුණු සංදේශ 02 ක් ද, කථානායකවරයාගේ නිවේදන 19 ක් ද, රජයේ පනත් කෙටුම්පත් 09 ක් ඇතුළුව පනත් කෙටුම්පත් 27 ක් ද, පනත් කෙටුම්පත් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ සහ අමාත්‍යවරුන්ගේ ලිපිලේඛන පිළිගැන්වීම යනාදිය ඇතුළත් පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළ දවසේ වැඩපිළිවෙළ භාෂාත්‍රයෙන්ම සකස් කරීමේ කටයුතු කරන ලදී.

viii) 2015 වර්ෂයට අදාළව ශෝක ප්‍රකාශ යෝජනා 07 ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර හැන්සාඩ් වාර්තාව අභාවප්‍රාප්ත මන්ත්‍රීවරයාගේ කලත්‍රයාට හෝ ජීවත්ව සිටින සමීප ඥාතීන්ට යැවීමට කටයුතු කටයුතු කරන ලදී.

ix) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සියලුම දත්ත සහ තොරතුරු ඇතුළත් පරිගණක මෘදුකාංග වැඩසටහන පවත්වාගෙන යාම සහ ඒවා නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම.

x) අටවැනි අභිනව පාර්ලිමේන්තුවට තේරී පත්වූ ගරු මන්ත්‍රීවරුන්ගේ තොරතුරු රැස්කිරීම සහ පාර්ලිමේන්තු ක්‍රියාදාමය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා 2015 අගෝස්තු මස 24, 25 සහ 26 යන දිනවල තොරතුරු කවුළුවක් පැවැත්වීම සහ ලබාගත් සියලු තොරතුරු පරිගණක පද්ධතියට උඩුගත කිරීම.

xi) 2015.03.13 දින ඉන්දිය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර ශ්‍රී මෝදි මැතිතුමා විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ඇමතිමට අදාළ සියලු ලිපි ලේඛන සකසා සභාවේ කටයුතු සංවිධානය කිරීම.

xii) 2015.09.01 දින අටවැනි අභිනව පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කරමින් පැවති එහි මංගල රැස්වීමේදි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් දීමට අදාළ ලේඛන ලිපිලේඛන සියල්ල සකසා සභාවේ කටයුතු සංවිධානය කිරිමට සහාය විම.

xiii) පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 14 ප්‍රකාරව විශේෂ පාර්ලිමේන්තු රැස්වීම් 02 ක් 2015.02.02 සහ 2015.07.03 යන දිනවල කැඳවීමට අදාළ සියලු ලිපිලේඛන සකස් කිරීම සහ සියලු මන්ත්‍රීවරු එම රැස්වීම් පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කිරීම.

xiv) 2015.04.28 වැනි දින සම්මත කරන ලද දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ විශේෂ කටයුතු සංවිධානය කිරීම.

## 5.5 අනෙකුත් ආයතනික අංශයන් මඟින් සැපයූ දායකත්වය සැකෙවින් :

### 1) වෙත්‍රධාරී දෙපාර්තමේන්තුව :

පාර්ලිමේන්තු ක්‍රියාදාමය සපුරාලීමට අවශ්‍ය පහසුකම් සළසනු පිණිස ගරු කථානායකතුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ඔවුනගේ කාර්ය මණ්ඩල, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සහ අනුබද්ධිත කාර්ය මණ්ඩල යන අංශවලට වෘත්තීය වශයෙන් කාලෝචිත සේවා සැපයීම මෙම දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

2015 වර්ෂය තුල දී වෙත්‍රධාරී දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් :-

i ) ආරක්ෂක කටයුතු

පාර්ලිමේන්තුවේ ආරක්ෂක තත්ත්වය ප්‍රශස්ත මට්ටමක පවත්වාගන්නා අතරතුර පූර්ව ආරක්ෂක කමිටු රැස්වීම්වලදී ගන්නා ලද දැඩි ආරක්ෂක විධිවිධාන තරමක් දුරට ලිහිල් කිරීමේ ක්‍රියාදාමයකට 2010 වසරේ සිට අවතීර්ණ විය. ගරු කථානායකතුමාගේ උපදෙස් ප්‍රකාර එම වැඩ පිළිවෙල 2015 වසරේ දී ද ක්‍රියාත්මක විය.

ආරක්ෂක තත්ත්වය උපරිම තලයක පවත්වා ගනිමින් යම් යම් ආරක්ෂක විධිවිධාන ලිහිල් කිරීමට 2015 වසරේ දී ද හැකි වූ අතර ඒ සම්බන්ධිත තීරණ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සහ කාර්ය මණ්ඩලය ද රාජ්‍ය නිලධාරීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව, ගරු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය ද රාජකාරි කටයුතු සඳහා පැමිණෙන රාජ්‍ය නිලධාරීන් ද පමණක් නොව පාර්ලිමේන්තු නැරඹීම පිණිස පැමිණෙන මහජනතාවට ද පහසුව සැලසුනි.

ආරක්ෂාව හා ඊට සම්බන්ධිත වෙනත් විෂයයන් යටතේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය හා අනුබද්ධිත කාර්ය මණ්ඩල සඳහා වැඩ මුළු, සම්මන්ත්‍රණ ආදිය සංවිධානය කිරීම සහ වෙත්‍රධාරි දෙපාර්තමේන්තු සේවකයින් සඳහා පුහුණු අවස්ථා ලබාදීම ද සිදු කරන ලදී.

ii) දෙපාර්තමේන්තුව මගින් 2015 වසර තුළ සංවිධානය කළ උත්සව සම්මන්ත්‍රණ, වැඩ මුළු සහ සාකච්ඡා:-

1) 2015 වසරේ රාජ්‍ය සේවක ප්‍රතිඥා දීමේ උත්සවය
2) හින්දු ආගමික උත්සවය හා සරස්වතී පූජාව
3) විදේශීය දූත කණ්ඩායම් පැමිණෙන අවස්ථාවන්හි දී අදාල කටයුතු සංවිධානය කිරීම.
4) විදේශ සම්බන්ධතා හා සන්ධාන කාර්යාලය මඟින් සංවිධානය කරන ලද උත්සව හා වැඩමුළු සඳහා පූර්ණ අනුග්‍රහය ලබාදීම.
5) වෙත්‍රධාරි දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ආරක්ෂක කටයුතු පිළිබඳ නිර්දේශ ආරක්ෂක අංශවල ක්‍රියාකාරි බව වැඩිකිරීමට හේතුවී ඇත.

6) කාර්ය මණ්ඩල පිවිසුමේ සහ මන්ත්‍රී පිවිසුමේ ස්ථාපනය කරන ලද නව එක්ස් කිරණ පද්ධති ඇතුළුව එක්ස් කිරණ පද්ධති නඩත්තුව සහ වැඩිදියුණු කිරීම හා සම්බන්ධ කටයුතු කරන ලදී.

7) ජයන්තිපුර හා නුග සෙවන පිවිසුම් වල ආරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මූලික පියවර ගත් අතර නව ඉදිකිරීම් සඳහා 2015 වසරේදී ද මූල්‍ය ප්‍රතිපාදන නොලැබුණි.

iii) ගරු කථානායකතුමා වෙනුවෙන් නිල අවශ්‍යතා ඉටු කිරීම.

iv) 2015.01.08 වැනි දින තේරී පත්වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් උත්සවාකාරයෙන් පාර්ලිමේන්තුව විවෘත කිරීමේ අවස්ථාවට අදාල උත්සවයේ සංවිධාන කටයුතු ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ උපදෙස් පරිදි ඉටු කිරීම.

v) 2015.08.17 දින පැවැති පාර්ලිමේන්තු මහා මැතිවරණයේදී තේරී පත්වූ අභිනව මන්ත්‍රීවරුන් වෙනුවෙන් පවත්වන ලද තොරතුරු කවුළුවේදී වේත්‍රධාරී දෙපාර්තමේන්තුවෙන් ඉටුවන කාර්ය හා වගකීම් සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කොට අවශ්‍ය තොරුතුරු ලබා ගැනීම, තාවකාලික හා ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීම.

vi) විශේෂ අමුත්තන්ගේ පැමිණීම (VIP Visits)

2015 වර්ෂය තුලදී විශේෂ අමුත්තන්ගේ පැමිණීම දළ වශයෙන් 450 ක් පමණ විය.

vii) විවිධ කාණ්ඩයන්ට අයත් ප්‍රවේශ අවසරපත් නිකුත් කිරීම.

(අ) අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ,රජයේ නිලධාරීන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාහන අවසරපත් ඇතුළු වාර්ෂික අවසරපත් 658 ක් නිකුත් කිරීම.

(ආ) රජයේ නිලධාරීන් සඳහා දෛනිකව නිකුත් කරනු ලබන ගැලරි අවසර පත් සහ රාජකාරි මැදිරි අවසරපත් ඇතුළු අවසර පත් 2325 ක් නිකුත් කිරීම.

(ඇ) කාර්ය මණ්ඩලයේ පෞද්ගලික වාහන අවසරපත් 591 ක් නිකුත් කිරීම.

(ඈ) මන්ත්‍රීවරුන්ගේ රියදුරන් වෙනුවෙන් වාහන අවසරපත් 225 ක් නිකුත් කොට ඇත.

(ඉ) පුවත්පත් වාර්තාකරුවන් හා පුවත්පත් පණිවිඩකරුවන් වෙනුවෙන් අවසරපත් 174 ක් නිකුත් කොට ඇත.

(ඊ) පාර්ලිමේන්තුව නැරඹීම පිණිස අවසරපත් නිකුත් කිරීම

| | |
|---|---|
| ගැලරි අවසරපත් සංඛ්‍යාව | 16150 |
| පාර්ලිමේන්තුව නැරඹීම සඳහා කණ්ඩායම් අවසර පත් | 3150 |
| කණ්ඩායම් වශයෙන් පැමිණි පාසැල් සිසු සිසුවියන් සඳහා අවසර පත් | 22520 |

| | |
|---|---|
| තාවකාලික මාසික අවසරපත් | 1050 |
| පූර්ව අවසරයකින් තොරව පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණි පාසැල් සිසුන් හා අනෙකුත් පුද්ගලයන් සඳහා | 50580 |

(උ) ගේට්ටු අවසරපත් නිකුත් කිරීම

| | |
|---|---|
| ජංගම දුරකථන, කැමරා උපකරණ ආදිය රැගෙන ඒම සඳහා | 8100 |
| භාණ්ඩ රැගෙන යාම සඳහා නිකුත් කළ ගේට්ටු අවසරපත් | 1225 |

(ඌ) අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සඳහා අවසරපත්

විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් පැමිණෙන යතුරුපැදි පණිවුඩකරුවන්ට පාර්ලිමේන්තුවට පැමිණීම සඳහා අවසර ලබාදීමේ ලිපි සැලකිය යුතු ප්‍රමාණයක්ද 2015 වසර තුලදී නිකුත් කරන ලදී.

**2) හැන්සාඩ් දෙපාර්තමේන්තුව :**

i) 2015 වර්ෂය තුළ දී පාර්ලිමේන්තු රැස්වීම් දින 82 ක් හැන්සාඩ් වාර්තාකරණයෙන් ආවරණය කරන ලදී.

ii) වර්ෂය තුළ පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, කාන්තා සංසදය, ළමා සංසදය, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, උපදේශක කාරක සභා (විශේෂ), ස්ථාවර කාරක සභා, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව ඇතුළු කාරක සභා වල රැස්වීම් 51 ආවරණය කරන ලදී.

iii) හැන්සාඩ් වාර්තා කාණ්ඩ 20 ක් අවසන් පොත් බැඳීම සඳහා යවා ඇත.

iv) අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 07 දෙනෙකුගේ ශෝක ප්‍රකාශ ඇතුලත් හැන්සාඩ් වාර්තා 07ක් මුද්‍රණය සඳහා යවා ඇත.

v) කාරක සභා වාර්තා 45 ක් සංස්කරණය කිරීමට කටයුතු කර ඇත.

vi) පාර්ලිමේන්තු ක්‍රියාදාමයන් පිළිබඳ තොරතුරු එකතු කිරීම, පාර්ලිමේන්තුව තුල සිදුවන කටයුතු පිලිබඳ සූචියක් පවත්වාගෙන යාම, පාර්ලිමේන්තුව තුළ හා කාරක සභා තුළ සිදුවන ක්‍රියාදාමයන් පිළිබඳව හඬ පටිගත කිරීම.

**3) පාර්ලිමේන්තු කථා පරිවර්තක කාර්යාලය :**

i) ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහා ගර්භය තුළ සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ ඉංග්‍රීසි භාෂා වලින් සමගාමී කථා පරිවර්තන සේවාවන් සැපයීම.

ii) ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, රජයේ නිලධාරින්ට සහ උපදේශක කාරක සභා සහ අනෙකුත් කාරක සභා වලට සහභාගිවන විවිධ නිලධාරින් සඳහා සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂා වලින් සමගාමී කථා පරිවර්තන පහසුකම් සපයා ඇත.

iii) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සහ අනෙකුත් සමගාමී පරිවර්තන පහසුකම් නොමැති කාරක සභා කාමර වලදී සමීපස්ථ කථා පරිවර්තන සේවාවන් සැපයීම.

iv) පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ පළකරනු ලබන වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සහ වාචික නොවන පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කරන ලද අතර එක් එක් අංශයන් විසින් පරිවර්තනය කරන ලද ප්‍රශ්න සංඛ්‍යාව පහත පරිදි වේ.

| අංශය | | ප්‍රශ්න සංඛ්‍යාව |
|---|---|---|
| සිංහල/ඉංග්‍රීසි අංශය | : | 551 |
| සිංහල/දෙමළ අංශය | : | 556 |
| දෙමළ/ඉංග්‍රීසි අංශය | : | 06 |

මීට අමතරව සභාව කල්තබන අවස්ථාවේ යෝජනා, පෞද්ගලික මන්ත්‍රී යෝජනා, සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු කථානායකතුමාගේ තීරණ, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ වාර්තා, විගණන ඡේද, පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ වාර්තා සහ විශේෂ කාරක සභාවල වාර්තා ආදිය පරිවර්තනය කර ඇත.

v) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් එවන ලද පෙත්සම් වල සාරාංශ, පුවත්පත් දැන්වීම්, ලිපි, වාර්තා, පෞද්ගලික මන්ත්‍රී යෝජනා, පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව, ගරු කථානායකතුමාගේ කාර්යාලයෙන් ලැබුණු ලිපි ලේඛන ආදිය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කර ඇති අතර එක් එක් අංශය විසින් පරිවර්තනය කරන ලද පිටු සංඛ්‍යාව පහත පරිදි වේ.

| අංශය | | පරිවර්තිත පිටු සංඛ්‍යාව |
|---|---|---|
| සිංහල/ඉංග්‍රීසි අංශය | : | 484 |
| සිංහල/දෙමළ අංශය | : | 411 |
| දෙමළ/ඉංග්‍රීසි අංශය | : | 393 |

**4) පාර්ලිමේන්තු පුස්තකාලය :**

සමාලෝචිත වර්ෂය තුල පාර්ලිමේන්තු පුස්තකාලයේ ග්‍රන්ථ සංරක්ෂණය කිරීමේ අරමුණෙන් ඒවා සංඛ්‍යාංක කෝෂ්ඨාගාරයක් ( Digital Repository) බවට පත් කිරීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය අන්තර් පාර්ලිමේන්තු සංගමයෙහි සහය පැතීමේ ප්‍රතිඵලයක් ලෙස එම සංගමය විසින් අධ්‍යයනයක් සිදු කිරීමෙන් අනතුරුව වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

i) පසුගිය වසර තුල පුස්තකාලයේ ප්‍රධාන එකතුවට නව ප්‍රකාශන සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා තුනෙන්ම අත්පත් කරගන්නා ලදී. එම එකතුවට පොත් 486ක්, පුවත්පත් 30ක් සහ වාර සඟරා 16ක් ඇතුලත් විය.

ii) ගරු කථානායකතුමා ඇතුළු මැති ඇමති වරුන් සහ පාර්ලිමේන්තු මහ ලේකම්තුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයේ රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය වන නොයෙක් තොරතුරු පහසුවෙන් පරිශීලනය කල හැකි ආකාරයට සකස් කරන ලදී.

iii) ජාතික වැදගත්කමකින් යුත් විවිධ විෂයයන් වලට අදාළ තොරතුරු ගොනු 1300 පමණ සකස් කරන ලදී.

iv) සමාලෝචිත වර්ෂය තුල පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් - 260, ගරු කථානායකතුමා / මහ ලේකම් කාර්යාලයේ කටයුතු - 54, පසුබිම් වාර්තා - 18, තාක්ෂණික වාර්තා - 12, පර්යේෂණ පත්‍රිකා - 10.

v) මීට අමතරව පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය විසින් " පාර්ලිමේන්තු ජර්නලය - 2015" ප්‍රකාශනයට පත් කරන ලදී.

**5) ආයතන කාර්යාංශය / මන්ත්‍රී සේවා කාර්යාංශය/ අභ්‍යන්තර විගණන කාර්යාංශය :**

**5.1 ආයතන කාර්යාංශය:-**

i) 2015 වර්ෂය තුළ දී පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 25 දෙනෙක් විවිධ විදේශ පුහුණු / අධ්‍යයන චාරිකා / සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූ අතර ඒවායින් සමහරක් විවිධ විදේශීය ආයතන වලින් ලබා දුන් මූල්‍ය අනුග්‍රාහකත්වය මත සංවිධානය කෙරිණි.

ii) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ජාතික ව්‍යාපාර කළමණාකරන ආයතනය, නිපුනතා සංවර්ධන පදනම, බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තන්ත්‍ර පුහුණු ආයතනය, ප්‍රාග් ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරන ආයතනය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA), පරිගණක අධ්‍යයන අංශය - කොළඹ විශ්ව විද්‍යාලය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ලස්සන ෆ්ලෝරා, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, ටෙක්නෝප්ලස් ඔටෝමේෂන්, යුනයිටඩ් මෝටර්ස් ලංකා පී එල් සි ආදී ආයතන මගින් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ විවිධ තනතුරු වලට අයත් නිලධාරීන් රැසකට පුහුණු අවස්ථා සපයා දුන් අතර එළිමහන් පුහුණු වැඩසටහන්, මාර්ග සංඥා පිළිබඳ වැඩසටහන්, ධනාත්මක ආකල්ප පිළිබඳ වැඩසටහන් සංවිධානය කොට පවත්වන ලදී.

iii) 2015 වර්ෂය තුලදී කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලං.ග.ම. මාර්ගස්ථ ගමන් අවසර 750 ක් නිකුත් කර ඇත.

iv) පාර්ලිමේන්තුව සඳහා නව දුරකථන සම්බන්ධතා ලබා දීමට කටයුතු කිරීම, ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන නාමාවලියට අවශ්‍ය තොරතුරු ලබා දීම, පාර්ලිමේන්තුවේ අභ්‍යන්තර දුරකථන නාමාවලිය යාවත්කාලීන කොට මුද්‍රණය කිරීම.

v) මහජන දේශන 3ක් වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කොට ඇත.

### 5.2 මන්ත්‍රී සේවා කාර්යාංශය :-

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිය මන්ත්‍රී ධූර වල කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය අනුමත කරන ලද පහසුකම් සහ සේවාවන් නිසි පරිදි හා කලට වේලාවට ඔවුන් වෙත ලබා දිමට කටයුතු කිරීම සහ පාර්ලිමේන්තුවේ අදාළ අංශ මඟින්ද, බාහිර අංශ මඟින්ද ඒවා යථා පරිදි සැපයෙන බවට වග බලා ගැනීම මෙම අංශයේ ප්‍රධාන රාජකාරිය වේ.

2015 වසර තුලදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නව රාජකාරී දුරකථන පහසුකම් ලබා දිම, ඔවුනට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය නියමිත ප්‍රමාණයන්ගෙන් සැපයීම, පුද්ගලික ආරක්ෂාව සඳහා ගිනි අවි නිකුත් කිරීමේදී අදාළ සම්බන්ධීකරණ කටයුතු කිරීම, ගරු කථානායකතුමාගේ නිල නිවසේ නඩත්තු කටයුතු, නුවර එළිය නිවාඩු නිකේතනයේ නඩත්තු කටයුතු හා මාදිවෙල මන්ත්‍රී නිවාස වල නඩත්තු කටයුතු සම්බන්ධිකරණය හා පාලනය කිරිම මෙම කාර්යාංශයෙන් සිදු කරනු ලැබේ.

### 5.3 අභ්‍යන්තර විගණන කාර්යාංශය :-

i) පාර්ලිමේන්තුවේ මානව සම්පත් සහ අනෙකුත් පොදු සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරිම දිරිමත් කිරීම තුලින් ආයතනික අරමුණු ඉටු කරගැනීම පිණිස පිහිටුවන ලද විගණන සහ කළමණාකරන කමිටුවේ රැස්වීම් 04 ක් පවත්වා ඇත.

ii) පාර්ලිමෙන්තුවේ සැපයීම් හා සේවා පිළිබඳ අඩුපාඩු, සේවකයින්ගේ සේවයට වාර්තා කිරිමේ ඇති නොසැලකිලිමත්කම්, ශීත කාමර ගබඩා කටයුතු වල අක්‍රමිකතා යනාදිය පිළිබඳ විමර්ශනය කර කලමණාකරනයට වාර්තා කිරීම පසුගිය වසරේ සිදුකර ඇත.

iii) තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා සම්බන්ධීකරණය වෙමින් පාර්ලිමේන්තුවේ භාවිතයට නොගැනෙන අයිතමයන් හෝමාගම කාර්මික විද්‍යාලයට ලබා දිමට කටයුතු කිරීම.

## 6) විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය :

i) පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ සාර්ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය හා ආශ්‍රිත සියළු ක්‍රියාකාරකම් සහ සේවාවන් ඉටුකරන ලදී.

ii) උක්ත සංගම් මඟින් පවත්වන ලද සම්මේලන, වැඩ මුළු, සංචාර, රැස්වීම්, අධ්‍යයන චාරිකා සහ සම්මන්ත්‍රණ (21 ක්) සඳහා සහභාගීවීමට ගරු කථානායකතුමාට, ගරු නියෝජ්‍ය කථානායකතුමාට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ට පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට, නියෝජ්‍ය මහ ලේකම්තුමාට සහ සහකාර මහ ලේකම්තුමියට අවස්ථාව සළසා දෙන ලදී.

iii) මීට අමතරව පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගම් හා අදාල ක්‍රියාකාරකම් පිළිබඳ වැඩ කටයුතු ඉටුකරන ලදී. (දැනට එබඳු සංගම් 50 ක් ක්‍රියාත්මක වේ)

**7) තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව :**

2015 වර්ෂයේදී තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් අතර තොරතුරු සහ සන්නිවේදන යටිතල ව්‍යුහය නඩත්තු කිරීම, අන්තර්ජාල ප්‍රවේශය වැඩිදියුණු කිරීම, නව ගෘහස්ථ යෙදුම් සකස් කිරීම, ගෘහස්ථව සකස් කරන ලද යෙදුම් නඩත්තු කිරීම, නඩත්තු සේවා ගිවිසුම් පිළිබඳව කටයුතු කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, පාර්ලිමේන්තු වෙබ් අඩවිය නඩත්තු කිරීම, පැමිණීමේ කළමනාකරණ පද්ධතිය උත්ශ්‍රේණිගත කිරීම සහ RFP ව්‍යාපෘතිය කෙටුම්පත් කිරීම වඩාත් වැදගත් වේ.

ඇමුණුම - 01



ඇමුණුම - 02

2015 වර්ෂයේදී සම්මත වූ පනත් කෙටුම්පත්

| අංකය | පනත් අංකය | නාමය | සහතිකය සටහන් කල දිනය |
|---|---|---|---|
| 1 | 1/2015 | විසර්ජන (සංශෝධන)<br>ஒதுக்கீடு (திருத்தம்)<br>Appropriation (Amendment | 2015-02-07 |
| 2 | 2/2015 | ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)<br>கடற்றொழில், நீர்வாழ் உயிரின வளங்கள் (திருத்தம்)<br>Fisheries and Aquatic Resources (Amendment) | 2015-03-02 |
| 3 | 3/2015 | දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන)<br>புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபை (திருத்தச்) சட்டம்<br>National Authority on Tobacco and Alcohol (Amendment) | 2015-03-03 |
| 4 | 4/2015 | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ<br>குற்றச்செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்பு<br>Assistance to and protection of victims of crime and witnesses | 2015-03-07 |
| 5 | 5/2015 | ජාතික ඖෂධ නියාමන අධිකාරිය<br>தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபை<br>National Medicines Regulatory Authority | 2015-03-19 |
| 6 | 6/2015 | මඩහපොල ශ්‍රී රත්තනපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)<br>மடஹபொல ஶ்ரீ ரத்னபாலராம விகாரையின் பௌத்த கல்வி அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்)<br>Madahapola Sri Rathanapalarama Religious and Buddhist Education (Incorporation) | 2015-04-06 |
| 7 | 7/2015 | ආගාමික හා විගාමික (සංශෝධන)<br>குடிவருவோர், குடியகல்வோர் (திருத்தம்)<br>Immigrants and Emigrants (Amendment) | 2015-06-03 |
| 8 | 8/2015 | ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ)<br>தேசிய ஆசிரியர் கல்வி அதிகாரசபை (நீக்கல்)<br>National Authority on Teacher Education (Repeal) | 2015-06-03 |
| 9 | 9/2015 | දේශිය ආදායම් (සංශෝධන)<br>உண்ணாட்டரசிறை (திருத்தம்)<br>Inland Revenue (Amendment) | 2015-10-30 |
| 10 | 10/2015 | මුදල්<br>நிதி<br>Finance | 2015-10-30 |
| 11 | 11/2015 | එකතු කළ අගය මත බදු (සංශෝධන)<br>சேர்பெறுமதி வரி (திருத்தம்)<br>Value Added Tax (Amendment) | 2015-10-30 |
| 12 | 12/2015 | ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)<br>நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்)<br>Nation Building Tax (Amendment) | 2015-10-30 |

| | | | |
|---|---|---|---|
| 13 | 13/2015 | ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)<br>பொருளாதாரச் சேவை விதிப்பனவு (திருத்தம்)<br>Economic Service Charge (Amendment) | 2015-10-30 |
| 14 | 14/2015 | ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන)<br>பந்தய, சூதாட்ட விதிப்பனவு (திருத்தம்)<br>Betting and Gaming Levy (Amendment) | 2015-10-30 |
| 15 | 15/2015 | විසර්ජන (සංශෝධන)<br>ஒதுக்கீடு (திருத்தம்)<br>Appropriation (Amendment) | 2015-12-03 |
| 16 | 16/2015 | විසර්ජන<br>ஒதுக்கீடு<br>Appropriation | 2015-12-19 |